## 480 කවුරු වුවත් ඔබ

කවුරු වුවත් ඔබ
කොතැන වුවත් ඔබ
මගේ සහෝදරයා //

පටපිළි ඇන්දත් වැරහැලි ඇන්දත්
ඔබ මගේ සොහොයුරෙකී
සිතුමට පැතුමට පටහැනි වුවත්
ඔබ මගේ සොහොයුරෙකී
ජාතිය පෙළපත මොනවවුවත්
ඔබ මගේ සොහොයුරෙකී
මිනිස් ලොවේ වෙසෙනා ඔබ සැම දෙන
මගේම සොහොයුරෙකී

ඔබේ දෙනෙත් අග නැගෙන කඳුළු දැක
මටද කඳුළු එනවා
ඔබේ සිතේ බර මටද දැනෙන විට
මසිත ද බර වෙනවා
ඔබේ හදේ ඇති දුක වැටහීමෙන්
මගේ හද කකියනවා
ඔබේ දයාබර අත අල්ලා මා
ඔබ හා එක් වෙනවා

ඔබේ හැඩය ගැන ඔබේ පැහැය ගැන
නැත මා විමසන්නේ
ඔබේ අඩුව ගැන ඔබේ වැඩිය ගැන
නැත මා විමසන්නේ
සොහොයුරු කැල්මෙන් ඔබ නෙතු බැල්මෙන්
මා ඔබ සලකන්නේ
කවුරු වුවත් ඔබ කොහේ වුවත් ඔබ
මට සොහොයුරු වන්නේ